# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2016

2022 නොවැම්බර් - 2023 ජනවාරි

**සමාජීය විද්‍යා පීඨය**

**ඉතිහාසය (නව/පැරණි නිර්දේශය)**

**ශ්‍රී ලංකාවේ ඉතිහාසය - ක්‍රි.ව. 1594 සිට 1972 දක්වා HIST – E 3015**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

01. ලංකාවේ පහතරට ප්‍රදේශ පාලනයේ දී පෘතුගීසීන් දේශීය පාලන රටාව සහ රාජ්‍ය ආදායම් ක්‍රමය ප්‍රයෝජනයට ගත් ආකාරය පැහැදිලි කරන්න.

02. පෘතුගීසීන් උඩරට රාජ්‍යය යටත් කරගැනීමට ගත් උත්සාහය විමර්ශනය කොට ඔවුන්ගේ එම ප්‍රයත්නයන් අසාර්ථක වීමට බලපෑ සාධක පෙන්වා දෙන්න.

03. ලන්දේසීන් උඩරට රාජධානිය සම්බන්ධව ගෙන ගිය පිළිවෙත හමුවේ දෙවන රාජසිංහ රජු ක්‍රියා කළ ආකාරය පරීක්ෂා කරන්න.

04. 1815 ගිවිසුමේ ඓතිහාසික වැදගත්කම ප්‍රමාණ කරන්න.

05. කෝල්බෲක් - කැමරන් කොමිසම මගින් යෝජනා කළ ආර්ථික හා පරිපාලන ප්‍රතිසංස්කරණ පරීක්ෂා කරන්න.

06. බ්‍රිතාන්‍යයන් යටතේ වතු වගා ආර්ථිකය පිළිබඳ විමසා, එමගින් ඇතිවූ සමාජ ආර්ථික පරිවර්තනයන් පරීක්ෂා කරන්න.

07. 1796-1900 දක්වා කාලය තුළ බ්‍රිතාන්‍යයන් මෙරට අධ්‍යාපනයේ ප්‍රගතිය උදෙසා ගත් ක්‍රියාමාර්ග කවරේදැයි විමසන්න.

08. 19 වන සියවස තුළ ඇති වූ බෞද්ධාගමික පුනර්ජීවනයෙහි ලා භික්ෂූන් වහන්සේලාගේ කාර්යභාරය ප්‍රමාණ කරන්න.

09. 1931 ඩොනමෝර් ආණ්ඩු ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ පැහැදිලි කොට එම යෝජනා ක්‍රියාත්මක කළ ආකාරය පරීක්ෂා කරන්න.

10. "1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ බිහි වූ ජනාධිපති ධූරය පූර්ණ විධායක බලතල සහිත ධූරයකි." විමර්ශනය කරන්න.

********************************